AL/2016/47-S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ட்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

| | | |
|---|---|---|
| ඉස්ලාම් ශිෂ්ටාචාරය I<br>இஸ்லாமிய நாகரிகம் I<br>Islamic Civilization I | 47 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

- ✻ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ✻ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ✻ උත්තර පත්‍රයේ පසුපිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- ✻ 1 සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

**1.** පහත දැක්වෙන ප්‍රකාශවලින් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) 'ඉක්රඃ බිස්මි රබ්බිකල්ලදී හලක්' යන අල්-කුර්ආනීය වාක්‍යය හිරා ගුහාවේ දී පහළ කරන ලදී.
(2) ඉස්ලාමීය දේශපාලන රටාවෙහි ස්වාධිපත්‍ය බලය රාජ්‍ය පාලකයා සතු ය.
(3) කාදියානිවරු සහාබාවරුන්ගේ කාලයේ දී ව්‍යාජ නබිත්වය ගැන ප්‍රචාරය කළ අය වේ.
(4) 'දාරුල් උලූම්' නම් පර්යේෂණ මධ්‍යස්ථානය කලීෆා මඃමූන් පුළුල් කළේ ය.
(5) සයිද් බින් හාරිතා (රළි), අල්-කුර්ආන් ගොනු කිරීමේ කටයුතුවලට සහභාගි වූ සහාබිවරුන්ගෙන් කෙනෙකි.

**2.** ක්‍රි. ව. 1526 දී පෘතුගීසින් විසින් කොළඹ ජීවත් වූ මුස්ලිම්වරුන් පිටමං කළ අවස්ථාවේ ඔවුන්ට සීතාවක ප්‍රදේශයේ රැකවරණය දුන් සිංහල රජතුමා,
(1) විමලධර්මසූරිය රජු ය. (2) මායාදුන්නේ රජු ය. (3) සෙනරත් රජු ය.
(4) බුවනෙකබාහු රජු ය. (5) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ය.

**3.** ෆික්හ් කලාවට ඉමහත් සේවාවක් ඉටු කළ ප්‍රධාන ඉමාම්වරු හතර දෙනා මුස්ලිම් ප්‍රජාව අතර ඉතා ම ප්‍රසිද්ධ ය. ජ්‍යෙෂ්ඨත්වය අනුව අනුපිළිවෙළින් ඔවුන්ගේ නම් දැක්වෙන වරණය තෝරන්න.
(1) ඉමාම් මාලික්, ඉමාම් අබූ හනීෆා, ඉමාම් ෂාෆීඊ, ඉමාම් අහමද් ඉබ්නු හන්බල්
(2) ඉමාම් අබූ හනීෆා, ඉමාම් මාලික්, ඉමාම් ෂාෆීඊ, ඉමාම් අහමද් ඉබ්නු හන්බල්
(3) ඉමාම් අබූ හනීෆා, ඉමාම් ෂාෆීඊ, ඉමාම් අහමද් ඉබ්නු හන්බල්, ඉමාම් මාලික්
(4) ඉමාම් ෂාෆීඊ, ඉමාම් අහමද් ඉබ්නු හන්බල්, ඉමාම් අබූ හනීෆා, ඉමාම් මාලික්
(5) ඉමාම් මාලික්, ඉමාම් අබූ හනීෆා, ඉමාම් අහමද් ඉබ්නු හන්බල්, ඉමාම් ෂාෆීඊ

**4.** පහත සඳහන් ඒවායින් 'සහෝදරත්වය' යන්න දක්වන අරාබි පදය කුමක් ද?
(1) අල්-ජමාඅත් (2) අල්-මුආඃහාත්
(3) අල්-හලාරත් (4) අල්-ඉමාරත්
(5) අල්-වරාසත්

**5.** දළ වශයෙන් ශතවර්ෂ පහක පමණ කාලයක් පැවති අබ්බාසීය කිලාෆතය ක්‍රි. ව. 1258 දී බිඳ වැටීමට හේතු වූ පිරිස වනුයේ,
(1) කුරුස යුධ භටයින් ය. (2) මජූසිවරු ය. (3) සෆාවිවරු ය.
(4) මොංගෝලියානුවෝ ය. (5) ගස්නාවිවරු ය.

**6.** ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරු අතර බිහි වූ පුවත්පත්වලින් 'අස්-සවාබ්' නම් පුවත්පතේ කර්තෘ
(1) ඩබ්. එම්. අබ්දුල් රහ්මාන් ය. (2) අයි. එල්. එම්. ඒ. අසීස් ය.
(3) වාප්පිච්චි මරික්කාර් ය. (4) එම්. ටී. අක්බර් ය.
(5) මාප්පිලෙ ලෙබ්බේ ආලිම් ය.

**7.** මක්කාවේ කුරයිෂිවරුන්ගේ තාඩන පීඩනවලට බිය වී තායිෆ් ගිය නබිතුමාට එහි දී ද අමිහිරි අත්දැකීම්වලට මුහුණ දීමට සිදු විය. එහි සිට නැවත මක්කාවට පැමිණි එතුමාට රැකවරණය සැපයූවේ,
(1) අදී බින් හාතිම් ය. (2) උමයියා බින් හල්ෆ් ය.
(3) වලීද් බින් මුර්රා ය. (4) සෆ්වාන් බින් උමයියා ය.
(5) මුත්ඉම් බින් අතී ය.

[දෙවැනි පිටුව බලන්න.

**8.** පහත **X** තීරුව යටතේ ග්‍රන්ථ කිහිපයක නම් ද, **Y** තීරුව යටතේ ඒවා රචනා කළ කර්තෘවරුන්ගේ නම් ද **අපිළිවෙළින්** දැක්වේ.

| X | Y |
|---|---|
| (i) අල්-හාවි | A - උමර් කයියාම් |
| (ii) මකාලත් ෆිල් ජබර් වල් මුකාබලා | B - අල්-කින්දි |
| (iii) ජාමිඋල් බයාන් | C - සකරිය්‍යා අර්-රාසි |
| (iv) රස්මුල් මෑමූර් මිනල් අර්ල් | D - ඉබ්නු සඅද් |
| (v) තබකාතුල් කබීර් | E - ඉබ්නු ජරීර් අත්-තබරි |

ඉහත සඳහන් ග්‍රන්ථවල අනුපිළිවෙළට කර්තෘවරුන්ගේ නම් පෙළගැස්වූ විට ලැබෙන නිවැරදි පිළිතුර ඇතුළත් වරණය තෝරන්න.

(1) ABDEC (2) BACED (3) BDAEC (4) CABDE (5) DBCEA

**9.** ඉන්දියාවේ මුස්ලිම් පාලනය ගෙන ගිය විවිධ රාජ්‍ය පරම්පරා අතුරෙන් 1526 සිට 1857 තෙක් ඉන්දියාව පාලනය කළේ,

(1) ලෝඩිවරුන් ය. (2) අයිබක්වරුන් ය. (3) තුග්ලක්වරුන් ය.
(4) මෝගල්වරුන් ය. (5) කිල්ජිවරුන් ය.

**10.** 'ෆුතූහුල් බුල්දාන්' යන නමින් හු විද්‍යා ක්ෂේත්‍රයට අදාළ ව ලියන ලද ග්‍රන්ථයේ කර්තෘ,

(1) අල්-කුවාරිස්මි ය. (2) අල්-බලාදූරි ය.
(3) ඉබ්නු ෂහ්රයාර් ය. (4) අල්-මස්ඌදි ය.
(5) අල්-ඉද්රීසි ය.

**11.** පහත නම් සඳහන් අයගෙන් අල්-කුර්ආනයට විවරණ ග්‍රන්ථ ලියූ මුෆස්සිර්වරයකු **නො වන්නේ** කවුද?

(1) සෙයියද් කුතුබ් (රහ්) (2) මවුලානා ඉල්යාස් (රහ්)
(3) ඉමාම් ඉබ්නුල් කසීර් (රහ්) (4) ෆකුරුද්දීන් අර්-රාසි (රහ්)
(5) මවුලානා මව්දූදි (රහ්)

**12.** අතීතයේ මුස්ලිම්වරුන් බහුතරයක් ජීවත් වූ රටවල් රැසක් විවිධ අරාබි නම්වලින් හැඳින්විණි. ඒවායින් ස්පාඤ්ඤය සහ සිරියාව යන රටවල් හැඳින්වූ අරාබි නම් වන්නේ පිළිවෙළින්,

(1) අන්දලූස් සහ ෂාම් ය. (2) මිස්ර් සහ මෑරිබ් ය.
(3) අල්හින්ද් සහ හබාෂා ය. (4) මෑරිබ් සහ මිස්ර් ය.
(5) අන්දලූස් සහ කුද්ස් ය.

**13.** ශ්‍රී ලාංකික මුස්ලිම්වරුන් ජාතියට කළ සේවය ඇගයීමක් වශයෙන් මුස්ලිම් විද්වතකුගේ නමින් ශිෂ්‍ය නේවාසිකාගාරයක් නම් කර ඇති ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලය කුමක් ද?

(1) කොළඹ විශ්වවිද්‍යාලය (2) අග්නිදිග විශ්වවිද්‍යාලය
(3) යාපනය විශ්වවිද්‍යාලය (4) නැගෙනහිර විශ්වවිද්‍යාලය
(5) පේරාදෙණිය විශ්වවිද්‍යාලය

More Past Papers at
tamilguru.lk

**14.** පහත සඳහන් ප්‍රකාශවලින් **අසත්‍ය** ප්‍රකාශය තෝරන්න.

(1) සෙල්ජුකියා කුඩා රාජ්‍යයේ අග්‍රාමාත්‍ය වශයෙන් නිලාමුල් මුල්ක් යන අය සේවය කළේ ය.
(2) එම්. එච්. මොහොමඩ් මහතා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායකවරයා වශයෙන් සේවය කළ අයෙකි.
(3) අකබා ගිවිසුම නබිතුමා හා මදීනාවාසීන් අතර සිදු වූයේ ය.
(4) ශ්‍රී ලාංකික මුස්ලිම්වරුන්ගේ මුල්කාලීන ජනපද දකුණු පළාතේ ද විය.
(5) සර්. පොන්නම්බලම් රාමනාදන් මහතාගේ 'ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය (Ethnology)' නම් ග්‍රන්ථයට විචාරක ග්‍රන්ථයක් ඒ. එම්. ඒ. අසීස් මහතා විසින් ලියන ලදී.

**15.** 'අර්-රිසාලා' සහ 'ඉහ්යා උලූමුද්දීන්' යන ග්‍රන්ථවල කර්තෘවරු වන්නේ පිළිවෙළින්,

(1) ඉමාම් මාලික් හා ඉමාම් හම්මාදු ය.
(2) ඉමාම් ෂාෆිඊ හා ඉමාම් අහමද් ය.
(3) ඉමාම් ඉබ්නු තයිමියා හා ඉමාම් අහමද් ය.
(4) ඉමාම් ෂාෆිඊ හා ඉමාම් ගස්සාලි ය.
(5) ඉමාම් මාලික් හා ඉමාම් අබූ හනීෆා ය.

**16.** ජාහිලිය්‍යා යුගයේ දී 'අය්යාමුල් අරබ්' යන්නෙන් අදහස් කළේ කුමක් ද?

(1) 'දාරුන් නද්වා'හි සාකච්ඡා පැවැත්වූ දින (2) උත්සව දින (3) ශෝක දින
(4) සටන් දින (5) කෑබාවෙහි ජනතාව රැස් වූ දින

**17.** මාප්පිලෙ ලෙබ්බේ ආලිම් නියෝජනය කළ සූෆි තරීක්කාව කුමක් ද?
(1) නක්ෂ බන්දිය්යා (2) ජිස්තිය්යා (3) කාදිරිය්යා
(4) ෂාදුලිය්යා (5) අෂ්-ෂුහ්රවර්දිය්යා

**18.** සිෆ්ෆින් යුද්ධයෙන් පසු කලීෆා අලි (රළි) සහ මුආවියා (රළි) යන දෙපිරිස අතර පැවැත්වූ සාම සාකච්ඡාවල දී කලීෆා අලි (රළි) තුමාගේ නියෝජිතයා වූයේ,
(1) කාලිද් බින් වලීද් (රළි) ය. (2) අබ්දුල්ලාහ් බින් උමර් (රළි) ය.
(3) අබු මූසා අල්-අෂ්අරි (රළි) ය. (4) අබු හුරයිරා (රළි) ය.
(5) අබ්දුල්ලාහ් බින් සුබයිර් (රළි) ය.

**19.** කලීෆා මඃමූන් විසින් රාජ්‍ය ප්‍රතිපත්තිය ලෙස ප්‍රකාශයට පත් කරන ලද මුඃතසිලා සිද්ධාන්තය පසුකාලීන ව එම තත්ත්වයෙන් ඉවත් කළ පාලකයා වූයේ,
(1) මුඃතසිම් ය. (2) මුස්තන්සීර් ය. (3) මුන්තසිර් ය. (4) මුතවක්කිල් ය. (5) අමීන් ය.

**20.** වර්තමාන ලෝකයේ විවිධ ප්‍රදේශවල පැතිර පවතින්නා වූ ප්‍රධාන දඃවා සංවිධාන හතරක් ඇත. එම සංවිධානවල නිර්මාතෘවරුන්ගෙන් කෙනකු **නො වන්නේ**,
(1) මවුලානා මෞදූදි (රහ්) ය. (2) මුහම්මද් ඉබ්නු අබ්දුල් වහාබ් (රහ්) ය.
(3) අබුල් හසන් අලි-නද්වි (රහ්) ය. (4) ඉමාම් හසනුල් බන්නා (රහ්) ය.
(5) ඉල්යාස් (රහ්) ය.

**21.** 'බෛඅතුල් රිල්වාන්' යනු,
(1) මක්කා ජයග්‍රහණයෙන් පසුව නබිතුමා මක්කාවාසී කුරෛෂිවරුනට ලබා දුන් පොදු සමාව ය.
(2) මුස්ලිම්වරුන් විසින් ජෙරුසලම ජයගත් පසු මුස්ලිම්වරුන් හා ක්‍රිස්තියානින් අතර ඇති වූ සාම ගිවිසුම ය.
(3) නබිතුමා සහ මිත්‍රවරුන් හුදයිබිය්යා ගිවිසුමේ දී උස්මාන් (රළි) තුමා වෙනුවෙන් මිය යන තෙක් සටන් කරන බවට කළ දිවුරුම ය.
(4) කඃබා පුනර් නිර්මාණයේ දී 'හජරුල් අස්වද්' නම් ගල තබනුයේ කවුද යන ගැටලුකාරී අවස්ථාවේ දී නබිතුමාගේ නායකත්වය යටතේ පැවති සාකච්ඡාව ය.
(5) සිෆ්ෆින් යුද්ධයෙන් පසුව කලීෆා අලි (රළි) සහ මුආවියා (රළි) ආදීන්ගේ නියෝජිතයන් සාම සාකච්ඡා පැවැත්වූ ස්ථානය ය.

**22.** සුල්තාන් සලාහුද්දීන් අයියූබි විසින් කුරුස භටයන් ජයගෙන ජෙරුසලම බේරාගත් වසර
(1) 1187 ය. (2) 1258 ය. (3) 1453 ය. (4) 1492 ය. (5) 1924 ය.

- මුස්ලිම් ඉතිහාසයේ මුස්ලිම් හා මුස්ලිම් නො වන පාලකයන් අතර සිදු වූ යුද්ධවල දී මුස්ලිම් හමුදා මෙහෙයවූ සෙන්පතිවරුන්ගේ නම් කිහිපයක් පහත දැක්වේ. ඒවා ඇසුරෙන් **23** සිට **27** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - සඃද් බින් අබී වක්කාස් B - සුල්තාන් සලාහුද්දීන් අයියූබි C - කාලිද් බින් වලීද්
D - තාරික් බින් සියාද් E - අබු උබයිදා බින් ජර්රාහ් F - මුහම්මද් බින් කාසිම්
G - අම්ර් බින් ආස් H - මුසන්නා බින් හාරිතා I - සුල්තාන් සයිෆුදීන් කුතුස්

**23.** 'ඓන් ජාලූත්' නම් ස්ථානයේ දී තාත්තාරිවරුන් පරාජයට පත් කළේ,
(1) B ය. (2) D ය. (3) F ය. (4) G ය. (5) I ය.

**24.** 'වක්අතුල් ජස්ර්' සටනේ දී තුවාල වී පසුව මිය ගිය සෙන්පතියා
(1) A ය. (2) C ය. (3) E ය. (4) G ය. (5) H ය.

**25.** 'සාල්දියා', 'මිස්ර්' යනාදී ප්‍රදේශ ජයගත් සෙන්පතිවරුන් පිළිවෙළින්,
(1) A හා G ය. (2) A හා H ය. (3) C හා E ය. (4) E හා G ය. (5) E හා H ය.

**26.** කලීෆා වලීද් බින් අබ්දුල් මලික්ගේ කාලයේ දී නැගෙනහිර හා බටහිර ප්‍රදේශවලට ඉස්ලාමීය රාජ්‍යය ව්‍යාප්ත කළ සෙන්පතිවරු දෙදෙනා පිළිවෙළින්,
(1) B හා E ය. (2) C හා E ය. (3) D හා F ය. (4) D හා I ය. (5) F හා G ය.

**27.** රෝම හා පර්සියානු ප්‍රදේශවල මුල් කාලයේ කළ හමුදා මෙහෙයුම්වල දී වෙන් වෙන් අවස්ථාවල දී හමුදා මෙහෙයවූ සෙන්පතිවරයා,
(1) A ය. (2) C ය. (3) E ය. (4) G ය. (5) H ය.

**28.** නබි (සල්) තුමා තම මිතුරන්ගෙන් සමහරෙකු සතු සුවිශේෂ හැකියා සලකා ඔවුන් විශේෂ නම්වලින් හැඳින්විය. ඒ අනුව හලාල්, හරාම් ගැන හොඳින් දන්නා සහාබිවරයා ලෙස සුවිශේෂ නාමයකින් හඳුන්වනු ලැබූයේ,
(1) මුස්අබ් බින් උමෛර් (රළි) ය.
(2) සයිද් බින් සාබිත් (රළි) ය.
(3) අබු උබයිදා අල් ජර්රාහ් (රළි) ය.
(4) මආද් බින් ජබල් (රළි) ය.
(5) අබූදර් අල් අෆ්ෆාරි (රළි) ය.

[ හතරවැනි පිටුව බලන්න.

● පහත දැක්වෙන්නේ ඉතිහාසයේ මුස්ලිම්වරුන්ට දේශපාලනික වශයෙන් ජයග්‍රහණ හා විනාශයන් ඇති කළ (ආසන්න) වසර කිහිපයකි. ඒවා ඇසුරෙන් **29** සිට **30** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - 1187 B - 1258 C - 1453
D - 1492 E - 1857 F - 1924

**29.** මුස්ලිම්වරු කොන්ස්තන්තිනෝපලය ජයගත් වසර හා මුස්ලිම් ස්පාඤ්ඤය මුස්ලිම්වරුන්ට අහිමි වූ වසර අනුපිළිවෙළින්,
(1) A හා B ය. (2) B හා C ය. (3) C හා D ය. (4) C හා F ය. (5) D හා C ය.

**30.** ඉන්දියාවේ මෝගල් අධිරාජ්‍යයේ පිරිහීමත් තුර්කියේ උස්මානීය අධිරාජ්‍යයේ පිරිහීමත් සටහන් වූ වසර අනුපිළිවෙළින්,
(1) B හා D ය. (2) C හා E ය. (3) C හා F ය. (4) D හා E ය. (5) E හා F ය.

● අංක **31** සිට **35** දක්වා එක් එක් ප්‍රශ්නයට අදාළ ව යෙදුම් දෙක බැගින් දී ඇත. එම යෙදුම්වලට වඩාත් ගැළපෙන සම්බන්ධතාව දැක්වෙන පිළිතුර පහත වගුව අනුව අංක (1), (2), (3), (4), (5) අතුරෙන් තෝරන්න.

| අංකය | පළමු යෙදුම | දෙවන යෙදුම |
|---|---|---|
| (1) | නිවැරදි ය. | නිවැරදි ය. |
| (2) | නිවැරදි ය. | වැරදි ය. |
| (3) | වැරදි ය. | නිවැරදි ය. |
| (4) | වැරදි ය. | වැරදි ය. |
| (5) | නිවැරදි ය. | පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| | පළමු යෙදුම | දෙවන යෙදුම |
|---|---|---|
| **31.** | අලිගාර් විශ්වවිද්‍යාලය ඉන්දීය අර්ධද්වීපයේ පිහිටුවා ඇත. | කලීෆා වලීද් බින් අබ්දුල් මලික්ගේ කාලයේ කාදිසිය්යා සටන ඇති විය. |
| **32.** | සිද්දි ලෙබ්බෙ, වාප්පිච්චි මරික්කාර් සහ ඔරාබි බාෂා ආදීහු කොළඹ සහිරා විද්‍යාලය ස්ථාපිත කළ අය වෙති. | 'පතාවා ආලම් කීරි' යනු උස්මානීය යුගයේ දී ගොනු කළ හදීස් විවරණ ග්‍රන්ථයකි. |
| **33.** | යහපත පමුණුවා අයහපත වැළැක්වීම යන කරුණ, උගත් මුස්ලිම්වරුන් අතර පමණක් අනිවාර්ය ය. | රුධිරය පෙණහලු තුළින් හෘදයේ දකුණු පැත්තෙන් වම් පැත්තට ළඟා වන බව කියැවෙන මතය ඉබ්නු නෆීස් නම් වෛද්‍ය විශාරදයා විසින් ඉදිරිපත් කරන ලදී. |
| **34.** | කලීෆා මුඃතසිම් විසින් නිර්මාණය කරන ලද බයිතුල් හික්මා, උමයියා කාලයේ අධ්‍යාපනික ප්‍රගතිය සනාථ කිරීමට හොඳ උදාහරණයක් වේ. | ශ්‍රී ලංකාවේ මුස්ලිම් පෞද්ගලික නීතිය පෘතුගීසින්ගේ කාලයේ පටන් ක්‍රියාත්මක විය. |
| **35.** | මුකද්දමතු ඉබ්නු කල්දූන්, ඉතිහාස ක්ෂේත්‍රයේ මුස්ලිම්වරුන්ගේ දායකත්වයට හොඳ ම උදාහරණයයි. | අකීදා විෂයය විඥානය ඇසුරු කරගෙන තේරුම් ගැනීමට වෑයම් කිරීම මුස්ලිම්වරුන් අතර මතවාදී කණ්ඩායම් බිහි වීමට ප්‍රධාන හේතුව විය. |

● පහත දැක්වෙන්නේ නබිතුමා ඇති කර ගත් ගිවිසුම් කිහිපයක කොන්දේසි වේ. ඒවා ඇසුරෙන් **36** සිට **38** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - සෑම කෙනා ම තම තමන්ගේ ආගමානුකූලව ජීවත් වීමේ අයිතිය ලබයි.
B - දෙපාර්ශ්වයට ම තමා කැමති අන් පාර්ශ්වයක් සමග සාමකාමී ගිවිසුමක් ඇති කර ගැනීමට අයිතිය ඇත.
C - අල්ලාහ්ට කිසිවක් සම කරන්නේ නැත.
D - දෙපාර්ශ්වය අතර දස අවුරුදු සටන් විරාමයක් පවත්වයි.
E - සතුරන්ගෙන් මදීනා නගරය ආරක්ෂා කිරීම දෙපාර්ශ්වයේ ම වගකීම වේ.
F - වරද කළවුන් කවුරු වුවත් ඔවුන්ට දඬුවම් පමුණුවනු ලැබේ.
G - නබිතුමාගේ නායකත්වය පිළිගෙන එතුමා සුරැකිය යුතු ය.
H - මිනීමැරීම, කොල්ලකෑම වැනි අපරාධ වළක්වා ගත යුතු ය.

**36.** ඉහත සඳහන් ඒවායින් අකබා ගිවිසුමේ අන්තර්ගත කොන්දේසි දෙකක් වනුයේ,
(1) A හා C ය. (2) A හා G ය. (3) C හා F ය. (4) C හා G ය. (5) E හා H ය.

**37.** මදීනා ගිවිසුමේ දක්නට ලැබෙන කොන්දේසි තුනක් වන්නේ
(1) A, C හා D ය. (2) A, E හා F ය. (3) B, F හා G ය. (4) C, D හා E ය. (5) E, F හා H ය.

**38.** හුදයිබිය්යා ගිවිසුමේ දැකිය හැකි කොන්දේසි දෙකක් වනුයේ,
(1) A හා B ය. (2) B හා D ය. (3) B හා H ය. (4) D හා E ය. (5) D හා G ය.

39. ශ්‍රී ලංකාවේ ඓතිහාසික ප්‍රසිද්ධියක් දරණ 'මස්ජිදුල් අබ්රාර්' පිහිටා ඇත්තේ,
(1) පුත්තලමේ ය. (2) කහටෝවිට ය. (3) බේරුවල ය. (4) වැලිගම ය. (5) බලංගොඩ ය.

40. 'නැමදුමට සුදුස්සා අල්ලාහ් පමණි' යන ප්‍රතිපත්තිය මත පිහිටා නිර්මාණය කරන ලද පළමු මස්ජිදය කඃබාව වේ. එහෙත් එහි බහුදේව වාදය ප්‍රකාශ කෙරෙන පිළිම රැසක් ම තබා තිබුණි. මක්කාවේ පිළිම වන්දනාව හඳුන්වා දුන් පුද්ගලයා,
(1) අබූ ලහබ් ය. (2) අම්ර් බින් හල්රම් ය. (3) උබයි බින් සලූල් ය.
(4) මාලික් බින් දූකයිරා ය. (5) අම්ර් බින් ලුහයි ය.

41. නබිතුමාගේ කාලයේ මෙන් ම ඉන් පසුව ද ඉස්ලාමයේ උන්නතිය සඳහා කැප වූ අයකු වන අබූබක්ර් (රළි) තුමාට 'අස්-සිද්දීක්' යන සුවිශේෂ නාමය හිමි වීමට හේතුව කුමක් ද?
(1) නබිතුමාගේ දූත මෙහෙවර ප්‍රථමයෙන් ම පිළිගැනීම
(2) ව්‍යාජ නබිවරු පරදවා ඉස්ලාමය රැකගැනීම
(3) 'ඉස්රාඋ' සහ 'මිඃරාජ්' නම් සිද්ධි මක්කා කාෆිර්වරු හෙළා දුටු විට ද 'නබිතුමා එසේ පැවසුවේ නම්, එය සත්‍යය ම යැ'යි විශ්වාසයෙන් යුක්තව පැවසීම
(4) හිජ්රත් අවස්ථාවේ සව්ර් ගුහාවේ නබිතුමා සමග සිටිමින් එතුමා සුරැකීම
(5) ඉස්ලාමය සඳහා ජීවත්ව, එය වෙනුවෙන් තම සියලු ම දේපළ පරිත්‍යාග කිරීම

42. මහා වංශයේ සඳහන් වන 'යෝනාස්' යන පදයෙන් කියැවෙන්නේ අරාබිවරුන් ය යන මතය දැක්වූ ඉතිහාසඥයන්ගේ කණ්ඩායමට ඇතුළත් **නො වන්නේ**
(1) සර්. එමර්සන් ටෙනන්ට් ය. (2) විල්හයිම් ගයිගර් ය.
(3) ආචාර්ය, ලෝනා දේවරාජා ය. (4) මහාචාර්ය, සිරිමා කිරිබමුණේ ය.
(5) ආචාර්ය, ආනන්ද ගුරුගේ ය.

43. ශතවර්ෂ අටක් පමණ මුස්ලිම්වරුන්ගේ පාලනය යටතේ පැවති ස්පාඤ්ඤයේ එකල සිටි පාලකයකු වූ I වන අබ්දුල් රහුමාන් විසින් ඉදිකළ සුප්‍රසිද්ධ මාලිගය
(1) අල්-හම්රා ය. (2) තාජ්මහල් ය. (3) අස්-සහ්රා ය.
(4) කුසයිර් අම්රා ය. (5) මුන්යත් අර්-රුසාෆා ය.

44. හදීස්වල විශ්වාසීභාවය පෙන්වීමට භාවිත කෙරෙන විවිධ පද අතුරෙන් 'මුත්තෆකුන් අලයිහි' යනු
(1) හදීසය අල්-කුර්ආන් වචන මගින් සහතික කිරීම ය.
(2) ඉමාම් බුහාරි (රහ්) සහ ඉමාම් මුස්ලිම් (රහ්) යන දෙදෙනා විසින් ම දන්වන ලද ඒවා ය.
(3) ඉමාම් මාලික් (රහ්) තුමා ප්‍රබල ලෙස සැලකූ හදීස් ය.
(4) නබිතුමා විසින් පවසා ඇතැයි දක්වා ඇති ව්‍යාජ හදීස් ය.
(5) නස් සාධක හෝ භෞතික සාධක හෝ නොමැතිව අල්-කුර්ආන් වාක්‍යවලට දෙන ව්‍යාඛ්‍යාන ය.

45. පහත සඳහන් අයගෙන් මුස්ලිම් ස්පාඤ්ඤ පාලකයකු **නො වන්නේ**,
(1) I වන අබ්දුර් රහ්මාන් ය. (2) හකම් බින් හිෂාම් ය. (3) අල්-මුස්තන්සිර් ය.
(4) යුසුෆ් බින් තස්හුබ් ය. (5) ඉබ්නුල් අහ්මර් ය.

46. කලීෆා අමීන්ගේ ඝාතනයෙන් පසුව මඃමූන් කලීෆා වශයෙන් පත් වුව ද ඔහු සෘජුව පාලනයට සම්බන්ධ නොවී ය. මෙම කාලයේ කලීෆා මඃමූන්ගේ අවසරය ඇතිව රජය ගෙන ගියේ,
(1) ෆස්ල් බින් සහ්ල් ය. (2) ෆස්ල් බින් රබීආ ය. (3) නිලාමුල් මුල්ක් ය.
(4) හසන් බින් සහ්ල් ය. (5) ඉමාම් අලි අර්-රිලා ය.

47. 'තුන්නූරයින්', 'දාතුන්නිතාකයින්' යන සුවිශේෂ නම්වලින් හැඳින්වූ දෙදෙනා පිළිවෙළින්,
(1) අලි (රළි) හා ෆාතිමා (රළි) ය.
(2) සුබයිර් (රළි) හා සුමයියා (රළි) ය.
(3) උස්මාන් (රළි) හා අස්මා බින්ත් අබීබක්ර් (රළි) ය.
(4) බිලාල් (රළි) හා හෆ්සා (රළි) ය.
(5) සඃදු බින් උබාදා (රළි) හා උම්මු සුලයිම් (රළි) ය.

More Past Papers at
tamilguru.lk

48. පහත දැක්වෙන වචනවලින් හතරක් කිසියම් ආකාරයකින් මාතෘකා දෙකක් යටතේ ගැළපෙන අතර එකක් පමණක් කිසිවක් හා නො ගැළපේ. එම **නො ගැළපෙන** වචනය තෝරන්න.
(1) අල්-මතන් (2) අල්-මුතවාතිර් (3) අත්-තස්කියා (4) අත්-තක්ලීද් (5) අත්-තරීකා

49. ඉබ්නුල් මුක්ලා, ඉබ්නුල් බව්වාබ් ආදී කලාකරුවන් සුප්‍රසිද්ධ වූයේ,
(1) සංගීතයට ය. (2) චිත්‍රවලට ය. (3) අක්ෂර රටාවලට ය.
(4) කවි සාහිත්‍යයට ය. (5) ගොඩනැගිලි කලාවට ය.

50. ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරු සඳහා වූ පෞද්ගලික නීතිය ක්‍රියාත්මක කිරීමට වැදගත් මෙහෙයක් ඉටු කළ ඉංග්‍රීසි රාජ්‍ය නිලධාරියා,
(1) සර්. ඇලෙක්සැන්ඩර් ජොන්සන් ය. (2) ෆ්‍රෙඩ්රික් නෝර්ත් ය. (3) පෝල්ක් ය.
(4) ජෝන් ඩොයිලි ය. (5) රොබට් බ්‍රවුන්රිග් ය.

***

AL/2016/47/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

| | | | |
|---|---|---|---|
| **ඉස්ලාම් ශිෂ්ටාචාරය** II<br>இஸ்லாமிய நாகரிகம் II<br>Islamic Civilization II | **47** | **S** | **II** |

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

**උපදෙස්:**
- ❋ I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
- ❋ සෑම ප්‍රශ්නයකට ම ලකුණු **20** බැගින් හිමි වේ.

## I කොටස

**1.** (i) රෝමවරුන් සමග මුස්ලිම්වරුන් සටන් වැදීමට හේතු වූ කරුණු **හතරක්** සඳහන් කරන්න.

(ii) ස්පාඤ්ඤය මුස්ලිම්වරුන් විසින් ජය ගනු ලැබීමට හේතු වූ කරුණු **හතරක්** සඳහන් කරන්න.

(iii) තුර්කියේ ඉස්ලාමීය කිලාෆතය පිරිහීම නිසා මුස්ලිම් උම්මතයට ඇති වූ බලපෑම් **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) උමයියා කිලාෆතය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කලීෆා උමර් බින් අබ්දුල් අසීස් (රහ්) විසින් දරන ලද උත්සාහය කෙටියෙන් විස්තර කරන්න.

(v) අබ්බාසිය කිලාෆතය ස්ථාවර කිරීමට කලීෆා අබු ජව්ෆර් අල්-මන්සූර් ගත් ක්‍රියාමාර්ග විස්තර කරන්න.

**2.** (i) ඉස්ලාමයට පෙර පැවති ශ්‍රී ලංකා-අරාබි පැරණි සම්බන්ධතාව තහවුරු කිරීමට ඇති සාධක **දෙකක්** දක්වන්න.

(ii) හිජ්රි පළමු ශතවර්ෂයේ දී ම ශ්‍රී ලංකාවට ද ඉස්ලාම් හඳුන්වා දී තිබුණු බවට සාධක **දෙකක්** දක්වන්න.

(iii) ශ්‍රී ලංකාවේ මුල්කාලීන මුස්ලිම් ජනපද වෙරළබඩ ආශ්‍රිත ව පිහිටීමට හේතු වූ කරුණු **හතරක්** දක්වන්න.

(iv) ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් අතර දක්නට ලැබෙන දකුණු ඉන්දීය සංස්කෘතියේ බලපෑම උදාහරණ **හතරක්** ඇසුරෙන් පැහැදිලි කරන්න.

(v) කොළඹ සහිරා විද්‍යාලයේ දියුණුව සඳහා ආචාර්ය ටී. බී. ජයා කළ සේවය විස්තර කරන්න.

**3.** (i) තව්හීදයේ ප්‍රධාන කොටස් **දෙක** සහ ඒවායේ අන්තර්ගත වැදගත් කරුණු **තුන** සඳහන් කරන්න.

(ii) මුස්ලිම්වරුන් අතර මුල් කාලයේ බිහි වූ ආගමික මතවාදී කණ්ඩායම් මුස්ලිම් උම්මා කෙරෙහි ඇති කළ බලපෑම් **හතරක්** සඳහන් කරන්න.

(iii) මිනිස් ජීවිතය හැඩගස්වා ගැනීමට රිසාලත් අවශ්‍ය වන්නේ ඇයි දැ'යි පැහැදිලි කරන්න.

(iv) මරණයෙන් පසු ජීවිතය පිළිබඳ විශ්වාසය මිනිස් ජීවිතය කෙරෙහි ඇති කරන බලපෑම් **හතරක්** සඳහන් කරන්න.

(v) කියාමා ඇති වන බවට නබිතුමා පුරෝකථනය කළ සිද්ධි **හතරක්** පහදන්න.

## II කොටස

**4.** (i) පවුල් ජීවිතය පිළිබඳ අල්-කුර්ආනයේ දැක්වෙන උපදේශ **පහක්** පැහැදිලි කරන්න.

(ii) ඉස්ලාමීය සංස්කෘතිය ගොඩනැගීමෙහිලා සුන්නාවෙහි දායකත්වය විමසන්න.

**5.** (i) මුස්ලිම්වරුන් තාරකා විද්‍යා ක්ෂේත්‍රයට යොමු වීමට මග පෑදූ හේතු පැහැදිලි කරන්න.

(ii) තාරකා විද්‍යාඥ අල්-කුවාරිස්මි, අල්-බිරූනි ආදීන්ගෙන් තාරකා විද්‍යා ක්ෂේත්‍රයට සිදු වූ දායකත්වය විස්තර කරන්න.

**6.** (i) කලීෆා අබ්දුල් මලික් බින් මර්වාන් මුහුණ දුන් අභියෝග හා ඔහු ඒවා ජයගත් ආකාරය විස්තර කරන්න.

(ii) කලීෆා වලීද් බින් අබ්දුල් මලික්ගේ කාලයේ රාජ්‍යය පුළුල් වූ ආකාරය පැහැදිලි කරන්න.

**7.** (i) හදීස් සුරැකීම සඳහා තාබිඊන්ගේ කාලයේ අනුගමනය කළ ක්‍රියාමාර්ග හා ඒවායේ ප්‍රතිඵල පිළිබඳ ව විස්තර කරන්න.

(ii) හිජ්රි 2 – 4 ශතවර්ෂ අතර කාලය 'ෆික්හ් කලාවේ රන් යුගය' ලෙස සැලකීමට වූ සාධාරණ හේතු ඉදිරිපත් කරන්න.

**8.** (i) 'ශිෂ්ටාචාරය' යන්න පහදා දී, ඉස්ලාමීය ශිෂ්ටාචාරය අනෙකුත් ශිෂ්ටාචාරවලින් වෙනස් වන ආකාරය පැහැදිලි කරන්න.

(ii) ඉස්ලාමීය ශිෂ්ටාචාරය පිරිහීමට හේතු **පහක්** පැහැදිලි කරන්න.

❋❋❋